**ශීර්ෂය 234 - ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර්**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර්හි 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර්හි මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 18 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ආයතනයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජුලි 28 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කල එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර්හි මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව ශ්‍රේෂ්ඨාධිකරණය මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කර ගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතු වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිළධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

**(අ)** මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව,

**(ආ)** ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

### 1.6.1 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | මූල්‍ය නොවන වත්කම්වල (ඒසීඒ - 6) ඉකුත් වර්ෂයේ අවසානයට ශේෂයක් නොතිබියදී සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය ලෙස රු. 13,757,201 ක් ගෙන තිබු අතර එය මූල්‍ය ප්‍රකාශන වල සටහනක් මඟින් හෝ හෙළිදරව් කර නොතිබුණි. | ආරම්භක ශේෂවල වෙනස්කම් මූල්‍ය ප්‍රකාශන වල සටහනක් මඟින් හෙළිදරව් කල යුතුවේ. | 2019 වර්ෂයේදී භාණ්ඩාගාරයේ එකගතාවය මත 2018.12.31 දිනට තිබු සියලු වත්කම් ආරම්භක ශේෂයන් ලෙස ගිණුම්වලට ඇතුලත් කොට ඇත. මෙය සටහන්වල වෙනම හෙළිදරව් කර නොමැත. |
| (ආ) | අයිතිය ශ්‍රේෂ්ඨාධිකරණය සතු වාහන 8 ක වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි. | නීත්‍යානුකූල අයිතිය ශ්‍රේෂ්ඨාධිකරණය සතු වත්කම් මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් කල යුතුවේ. | වාහන ගිණුම්ගත කිරීම සඳහා භාණ්ඩාගාරයේ ගිණුම් දෙපාර්තමේන්තුව සමග සාකච්ඡා කලත් වටිනාකම පිළිබඳ අවසන් එකගතාවයකට පැමිණීමට නොහැකි විය. 2020 වර්ෂයේදී ශ්‍රේෂ්ඨාධිකරණය සතු සියලු වාහන රක්ෂණ වටිනාකම මත පදනම්ව ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුල ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ සහ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ මිළ දී ගැනීම සඳහා රු. 8,511,764 ක් වැය කර තිබුණත් මූල්‍ය ප්‍රකාශනයේ (ඒසීඒ - 6 ආකෘතිය) මිළ දී ගැනීම් මඟින් ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම් රු.8,385,061 ක් ලෙස දැක්වීම නිසා රු.126,703 ක් අඩුවෙන් ගිණුම්ගත වී තිබුණි. | වර්ෂයේ වත්කම් අත්පත් කර ගැනීමේ වියදම, ප්‍රාග්ධනිත කල යුතුවේ. | සමාලෝචිත වර්ෂයේ වත්කම් අත්පත් කර ගැනීමේ වැය විෂයය අංකයන් යටතේ වර්ෂය තුල රු.8,511,764ක් වියදම් කර **CIGAS** වැඩසටහන යටතේ මූල්‍ය නොවන වත්කම 9152 යටතේ සහ 9165 යටතේ ස්වයංක්‍රියව සිදුවන බව දැනුම් දෙන අතර මේ පිළිබඳ භාණ්ඩාගාරයේ ගිණුම් දෙපාර්තමේන්තුවට අවශ්‍ය පියවර ගැනීම සඳහා දැනුම්දීමට කටයුතු කරමි. |

**1.6.2 අත්තිකාරම් ගිණුම් ශේෂ**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රජයේ නිලධාරීන්ට අත්තිකාරම් "බී" ගිණුමේ 2019 දෙසැම්බර් 31 දිනට ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර්හි පොත් අනුව හර ශේෂය රු. 38,731,193 ක් වුවත් භාණ්ඩාගාර පොත් අනුව ශේෂය රු.38,662,948 ක් වීම නිසා රු.68,245 ක් ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර්හි පොත්වල වැඩියෙන් දක්වා තිබුණි. 2011 දෙසැම්බර් සිට පැවැත එන මෙම ශේෂයට සම්බන්ධ ලේඛණ නොමැතිවීම නිසා මෙම වෙනස නිවැරදි නොකර දිගින් දිගටම ඉදිරියට ගෙන එමින් පැවතුණි. | නොසැසඳීම් සම්බන්ධයෙන් සොයා බලා නිවැරදි කිරීමට නොපමාව පියවර ගත යුතුවේ. | වෙනස නිවැරදි කර ගැනීමට උත්සාහ කලමුත් මෙතෙක් නොහැකි වී ඇත. අදාල පාර්ශවයන් සමග සාකච්ඡා කර මෙය 2020 වර්ෂය අවසන් වනවිට නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**1.6.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණ | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| **(අ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | | |
| (i) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛයේ 3.1ඡේදය | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව වාහන 06 ක් සඳහා ඉන්ධන පරීක්ෂාවන් සිදු කර නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කල යුතුවේ. | 2020 වර්ෂයේ සිට වාහනවල ඉන්ධන දහනය වීම ගණකාධිකාරිවරයාගේ සුපරික්ෂාව යටතේ පරීක්ෂා කිරීමට කටයුතු කර ඇත. |

| | | | |
|---|---|---|---|
| (ii) 2018 ජනවාරි 24 දිනැති අංක 05/2008(i) දරන චක්‍රලේඛය | පුරවැසි ප්‍රඥ්ඥප්තිය ක්‍රියාවට නංවා නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කල යුතුවේ. | ශ්‍රේෂ්ඨාධිකරණ පද්ධතිය දෙපාර්තමේන්තුවක් ලෙස පැවතියද, එමගින් මූලිකව අධිකරණමය කටයුතු සිදුවන බැවින් රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ 5/2008 සහ 5/2008(1) අනුව ප්‍රඥප්තිගත වීමක් මෙතෙක් සිදු කර නැති නමුත් මහජන අවශ්‍යතා කඩිනමින් කාර්යක්ෂමව ගුණාත්මකව සහ අඛණ්ඩව ඉටු කර ගෙන ඇත. කෙසේ වෙතත් ශ්‍රේෂ්ඨාධිකරණ රීතිවලට අණුනුකූල නොවන පරිදි පුරවැසි ප්‍රඥප්තියක් පිළියෙල කිරීමට මේ වන විට කටයුතු කරමින් සිටින බව දැනුම් දෙමි. |
| (iii) 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන චක්‍රලේඛය | මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කල යුතුවේ. | 2020 වර්ෂය සඳහා සකස් කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දෙන අතර ඉදිරි ක්‍රියාමාර්ග ගෙන ඇත. |

**(ආ) ජාතික අයවැය චක්‍රලේඛය**

**---------------**

| | | | |
|---|---|---|---|
| 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන චක්‍රලේඛයේ 1.1.6 උප වගන්තිය | 2019 ජුනි 03 ස්ථාන මාරු වී ගොස් සිටි නිලධාරිනියකගේ ආපදා ණය රු.197,060 ක් හා උත්සව අත්තිකාරම් රු.8,750 ක් වශයෙන් එකතුව රු.205,810 ක මුළු ණය ශේෂය අයකර ගෙන නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කල යුතුවේ. | මෙම වර්ෂයේ දී නිරවුල් කිරීම සිදු කරන ලෙස අධිකරණ අමාත්‍යාංශය වෙත දැනුම් දීමට කටයුතු කරන ලෙස උපදෙස් දෙන ලදී. |

## 2. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1 බැංකු ගිණුම් මෙහෙයවීම

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 1983 අගෝස්තු 24 දින ලංකා බැංකුවේ ආරම්භ කර තිබූ ජංගම ගිණුමෙහි 2019 දෙසැම්බර් 31 දිනට වූ රු.21,014,984 ක ශේෂය වර්ෂ ගණනාවක සිට අක්‍රීයව ඉදිරියට ගෙන එමින් තිබුණි. | භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ උපදෙස් අනුව කටයුතු කල යුතුවේ. | 2019.12.31 දිනට ශේෂයෙන් රු.21,000,000 ක මුදලක් නඩු වෙනුවෙන් තැන්පත් කර ඇත.මෙය නිරවුල් කිරීම සඳහා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් උපදෙස් ගැනීමෙන් පසු මෙම ගිණුම වසා දැමීමට තීරණය කර ඇත. ඉතිරි ශේෂය වූ රු.14,984 ක මුදල හදුනා ගැනීමට කටයුතු කරමින් සිටි. |
| (ආ) 2017 පෙබරවාරි මාසයේ දී අනාවරණය කර ගෙන තිබූ එකතුව රු. 48,978 ක් වූ බැංකු ගත නොවූ මුදල් දිගින් දිගටම බැංකු සැසඳුම් ප්‍රකාශනයේ දක්වා තිබුණි. | බැංකු ගත නොවීමට හේතු හඳුනා ගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම කඩිනමින් කල යුතුවේ. | 2017 පෙබරවාරි මාසයේදී අනාවරණය කර ගෙන තිබූ රු 48,978 ක බැංකු ගත නොවූ තැන්පතු සඳහා විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීම අධිකරණ සේවා කොමිෂන් සභාව හා අධිකරණ අමාත්‍යාංශ මඟින් සිදු කරන බැවින් අදාල ශේෂය නිරවුල් කිරීමට නොහැකි වී ඇත. |

## 3. මානව සම්පත් කළමනාකරණය

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ශ්‍රේෂ්ඨාධිකරණයේ අධිකරණ රෙජිස්ට්‍රාර් II තනතුරක් හා යතුරුලේඛක තනතුරු 02 ක් සඳහා අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා 06 දෙනෙකු බඳවා ගෙන තිබුණි. | අතිරික්ත කාර්ය මණ්ඩල සංඛ්‍යාව අනුමත කරවා ගැනීමට කටයුතු කල යුතුවේ. | අධිකරණ රෙජිස්ට්‍රාර් II සහ යතුරු ලේඛක බඳවා ගැනීමේ බලය ඇත්තේ අධිකරණ සේවා කොමිෂන් සභාවට පමණි. වත්මන් සේවා අවශ්‍යතාවය මත අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් ස්ථාන මාරු කර එවන ලද සහ අනුයුක්ත කර එවන ලද නිලධාරීන් වේ. |

| | | | |
|---|---|---|---|
| **(ආ)** | අභියාචනාධිකරණයේ වැඩසටහන් සහකාර තනතුර සඳහා අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා 05 දෙනෙකු බඳවා ගෙන තිබුණි. | අතිරික්ත කාර්ය මණ්ඩලය අනුමත කරවා ගැනීමට කටයුතු කල යුතු වේ. | අධිකරණ සේවා කොමිෂන් සභාව හරහා කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම සඳහා ඉදිරියේ දී කටයුතු කරමි. |
| **(ඇ)** | ශ්‍රේෂ්ඨාධිකරණයේ අනුමත තනතුරු 06 ක් සඳහා කාර්ය මණ්ඩල 17 දෙනෙකුගේ පුරප්පාඩු පැවතුණි. | ආයතනයේ අරමුණු හා ප්‍රධාන කාර්යයන් ඵලදායීව ඉටුකිරීමට අවශ්‍ය කාර්ය මණ්ඩලය පිළිබඳ යම් ඇගයීමක් කර අත්‍යාවශ්‍ය පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළයුතු වේ. | අධිකරණ රෙජිස්ට්‍රාර් , අධිකරණ ලිපිකරු, අධිකරණ ලඝු ලේඛක (ඉංග්‍රීසි)තනතුරු වල පුරප්පාඩු අධිකරණ සේවා කොමිසම දැනුවත් කර ඇත.<br>භාෂා පරිවර්තක සංවර්ධන නිලධාරී ප්‍රාථමික හා තාක්ෂණික නොවන ශ්‍රේණියේ තනතුරු වල පුරප්පාඩු අධිකරණ අමාත්‍යාංශය දැනුවත් කර ඇත. |
| **(ඈ)** | අභියාචනාධිකරණයේ අනුමත තනතුරු 07 ක් සඳහා කාර්ය මණ්ඩල 20 දෙනෙකුගේ පුරප්පාඩු පැවතුණි. | ආයතනයේ අරමුණු හා ප්‍රධාන කාර්යයන් ඵලදායීව ඉටුකිරීමට අවශ්‍ය කාර්ය මණ්ඩලය පිළිබඳ යම් ඇගයීමක් කර අත්‍යාවශ්‍ය පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කල යුතුවේ. | රෙජිස්ට්‍රාර් තනතුරෙහි විශ්‍රාම ගැනීම නිසා පුරප්පාඩු ඇති වී ඇත. ලිපිකරු, ලඝු ලේඛක, යතුරු ලේඛක, පොත් බැඳුම්කරු තනතුරු වල පුරප්පාඩු අධිකරණ සේවා කොමිෂම ද, භාෂා පරිවර්තක කා.කා. ස තනතුරු වල පුරප්පාඩු අධිකරණ අමාත්‍යාංශය ද දැනුවත් කර ඇත. |